# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1530/13 – 2008 ජනවාරි 01 වැනි අඟහරුවාදා– 2008.01.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

3 වන වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වගන්තිය සමඟ කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ 2006 ඔක්තෝබර් 05 දිනැති සහ අංක 1465/19 දරන අති විශේෂ *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග 2008.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

එම උපලේඛනයේ 04 සහ 10 අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පිළිවෙලින් පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් ;

| | | | |
|---|---|---|---|
| "4 | (අ) | මත්පැන් විකිණීමේ නිරත වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් හැර වෙනත් යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් කර ගෙන යාමට බලපත්‍රයෙහි සඳහන් යම් කාල පරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 1000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මේවායින් කවර හෝ අඩු මුදල |
| | (ආ) | මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කර ගෙන යාමට බලපත්‍රයේ සඳහන් යම් කාල පරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 10,000.00 |
| 10 | | යම් මුදලක් හෝ වෙනත් දේපළක් සඳහා දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක් ; | |
| | (අ) | රු. 25,000.00 ක් හෝ ඊට අඩු මුදල් ප්‍රමාණයක් මත | නිදහස් |
| | (ආ) | රු. 25,000.00 කට වැඩි වන මුදල් ප්‍රමාණයක් මත | රු. 25.00" |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2007 දෙසැම්බර් 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

01-494